# සුසාන භූමි සහ භූමදාන ඉඩම් පිළිබඳ ආඥාපනත

## 231 වන අධිකාරය

පොදු පරිශීලනය සඳහා පමණි - ගාමිණී ගුණසේකර

2005 අංක 12 දරන දඩ මුදල් වැඩි කිරීමේ පනතෙන් අවසන් වරට කරන ලද සංශෝධනය දක්වා සංශෝධන ඇතුළත් කර ඇත

## සුසාන භූමි සහ භූමදාන ඉඩම් පිළිබඳ ආඥාපනත

### පටුන


| වගන්තිය | විස්තරය | පිටුව |
|---|---|---|
| 1. | ලුහුඬු නාමය | 1 |
| 2. | දැනට තිබෙන ප්‍රකාශන, රීති, දැන්වීම්, අතුරු ව්‍යවස්ථා ආදිය අවලංගු කරන තෙක් වලංගු බව | 1 |
| 3. | අර්ථ නිරූපණය | 1 |
| 4. | ප්‍රකාශන ආදිය ගැසට් පත්‍රයේ පළ කළ යුතු බව | 2 |
| 5 (1). | පොදු සුසාන පිහිටුවීම අමාත්‍යවරයාට කළ හැකි බව | 2 |
| 5 (2). | වෙනත් තැන්වල මිනී වැළලීම් තහනම් කිරීම | 2 |
| 5 (3). | ආඥාපනතේ ඇතැම් කොටස් අදාළ වීමෙන් සුසාන නිදහස් කළ හැකි බව | 2 |
| 6. | සුසාන භූමිවල කාර්යය සඳහා ඉඩම් සැපයිය යුතු බව | 2 |
| 7. | අත්හරින ලද සුසාන පිළිබඳ ඉඩම් විකිණීම තහනම් කර ඇති බව | 3 |
| 8. | පොදු සුසාන ගෙවල්වලට දුරින් පිහිටිය යුතු බව | 3 |
| 9. | පල්ලි ආදිය තැනිය හැකි බව | 3 |
| 10. | පොදු සුසාන වට කොට තිබිය යුතු බව | 3 |
| 11 (1). | ප්‍රසිද්ධ සුසානය වෙන් කර දීම | 3 |
| 11 (2). | භාරකාරයන් විසින් පාලක මණ්ඩලයක් පත් කළ හැකි බව | 3 |
| 11 (2). | භාරකාර මණ්ඩලයේ බලතල | 3 |
| 12. | පොදු සුසාන වැළලීම සඳහා පමණක් ම පාවිච්චි කළ යුතු බව | 4 |
| 13. | ආගමික නිකායක පූජකවරයකුට ආගමික මෙහෙය සිදු කළ හැකි බව | 4 |
| 14. | බලයක් නොමැතිව මෘතදේහය ඉවත් නො කළ යුතු බව | 4 |
| 15. | භූමදාන ලියා පදිංචි කළ යුතු බව | 4 |
| 16. | පාලකයකු, වළවල් භාරන්නකු ආදීන් පත් කිරීම නිසි බලධරයා විසින් කළ යුතු බව | 5 |
| 17. | විනීත භාවය, ගරු සරු භාවය හා මිනී වළවල් වල ගැඹුර ආදී කරුණු පිළිබඳ නියෝග සෑදීම | 5 |
| 18. | දේවස්ථාන හෝ ගොඩනැගිලි තුළ හෝ ඒවාට ආසන්න ව මිනී වැළලීම නො කළ යුතු බව | 5 |
| 19. | පොදු සුසානයේ ඇතැම් කොටස් විශේෂ භූමදාන සඳහා වෙන් කර තැබිය හැකි බව | 5 |
| 20. | භූමදාන කිරීමේ විශේෂ අයිතිවාසිකමක් ප්‍රදානය කිරීමේ ආකෘතිය | 6 |

## සුසාන භූමි සහ භූමදාන ඉඩම් පිළිබඳ ආඥාපනත

### පටුන


| වගන්තිය | විස්තරය | පිටුව |
|---|---|---|
| 21. | ප්‍රදාන පිළිබඳ ව ලේඛනයක් තබා ගත යුතු බව | 6 |
| 22. | ගාස්තු ආදිය සඳහා නිසි බලධරයා විසින් නියෝග සෑදිය යුතු බව | 6 |
| 23. | සුසානයේ සැලැස්ම සහ කෝශ ග්‍රන්ථය පරීක්ෂාව සඳහා තැබිය යුතු බව | 7 |
| 24. | භූමදාන කිරීමේ විශේෂ බලය පවරා දෙන ආකෘති පත්‍රය හා පවරා දීම ලියා පදිංචි කළ යුතු බව | 7 |
| 25. | කැමැත්තක් නැතිව, භූමදාන කිරීමේ විශේෂ අයිතියට අවහිර නොකළ යුතු බව | 7 |
| 26. | නුසුදුසු ලෙස ගොඩ නැංවූ ස්මාරක ඉවත් කිරීම | 7 |
| 27. | 9 වන, 11 වන සහ 19 වන වගන්තිවලින් පැවරී ඇති බලතල ක්‍රියාවේ යෙදවීම; නිසි බලධරයා ප්‍රතික්ෂේප කළ අවස්ථාවක දී ඒවා ක්‍රියාවේ යෙදවීමට අමාත්‍යවරයාට හැකි බව | 8 |
| 28. | පොදු සුසානයකට හානි කිරීමට දඬුවම් | 8 |
| 29. | පොදු සුසානයෙහි ක්‍රීඩා පවත්වන හෝ ගිනිකෙළි පවත්වන හෝ සෙසු කරදරකාරී වැඩක යෙදෙන තැනැත්තන්ට දඬුවම් | 8 |
| 30. | නියෝග කඩ කිරීම | 8 |
| 31. | “පොදු පූජා ස්ථානය” යන්නෙහි අර්ථ නිරූපණය | 9 |
| 32. | පොදු පූජාස්ථාන ආදියෙහි භූමදාන කිරීම තහනම් කර ඇති බව | 9 |
| 33. | අලුත් පුද්ගලික සුසාන අමාත්‍යවරයා විසින් අනුමත කළ යුතු බව | 9 |
| 34. | පුද්ගලික සුසානවල භූමදාන හා ආදාහන කිරීම නැවැත්වීම | 9 |
| 35. | පුද්ගලික සුසානවල භූමදාන හෝ ආදාහන නැවැත්වීමේ නියෝගයකින් පසුව එසේ නො කළ යුතු බව | 9 |
| 36. | පුද්ගලික සුසාන කොටු කර තැබිය යුතු හා කැලෑවෙන් එළි පෙහෙළි කර තැබිය යුතු බව | 10 |
| 37. | බලයක් නැතිව පුද්ගලික සුසානයකින් මෘතදේහයක් ආපසු ගෙන යා නො හැකි බව | 10 |
| 38. | අතුරු ව්‍යවස්ථා | 10 |
| 39. | අතුරු ව්‍යවස්ථා අමාත්‍යවරයා විසින් අනුමත කළ යුතු බව | 10 |
| 40. | ලියා පදිංචි නො කළ පුද්ගලික සුසානවල හෝ පොදු සුසානයක් නොවූ තැනක භූමදාන කිරීම හා ආදාහන කිරීම තහනම් කිරීම | 11 |
| 41. | අතුරු ව්‍යවස්ථා කඩ කිරීම වරදක් වන බව | 11 |
| 42. | වැරදි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට මහේස්ත්‍රාත් අධිකරණයට බලය ඇති බව | 11 |
| 43. | නඩු පැවරීම පිළිබඳ සීමා කිරීම | 12 |

## සුසාන භූමි සහ භූමදාන ඉඩම් පිළිබඳ ආඥාපනත

### පටුන


| වගන්තිය | විස්තරය | පිටුව |
| --- | --- | --- |
| 44. | තොරතුරු සපයන්නාට දඩයෙන් කොටසක් | 12 |
| 45. | දඩ මුදල් යෙදවීම | 12 |
| | උප ලේඛනය (20 සහ 24 වන වගන්ති අනුව) | |
| | “අ” ආකෘතිය - පොදු සුසානයක භූමදාන ස්ථානයක් ප්‍රදානය කරන ආකෘතිය | 12 |
| | “ආ” ආකෘතිය - පෙදු සුසානයක භූමදානය සඳහා නොමිලයේ භූමියක් ප්‍රදානය කරන ආකෘතිය | 13 |
| | “ඇ” ආකෘතිය - භූමදාන කිරීමේ අයිතිවාසිකම පවරා දීමේ ආකෘතිය | 14 |


පහසු පරිශීලනය සඳහා පමණි - ගාමිණී ගුණසේකර

පොත් පරිශීලනය සඳහා පමණි - ගාමිණී ගුණසේකර

# 231 වන අධිකාරය

# සුසාන භූමි සහ භූමදාන ඉඩම් පිළිබඳ ආඥාපනත

පොදු සුසාන සහ පුද්ගලික සුසාන භූමි හා සම්බන්ධ වූ නීතිය ඒකාබද්ධ කිරීම සඳහා පනවන ලද ආඥාපනතකි.

1899 අංක 9 දරන ආඥාපනත

1921 අංක 9,
1923 අංක 3,
1929 අංක 14,
1931 අංක 7,
1937 අංක 14,
1939 අංක 61,
1946 අංක 3,
1946 අංක 57,
1947 අංක 29
දරන ආඥාපනත්

2005 අංක 12
දරන පනත

[1900 ජනවාරි මස 01 වන දින]

**1**. මෙම ආඥාපනත සුසාන භූමි සහ භූමදාන ඉඩම් පිළිබඳ ආඥාපනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

## I වන පරිච්ඡේදය

### ප්‍රාරම්භය

**2**. මේ ආඥාපනත මගින් අවලංගු කරන ලද කිසියම් නීතියක් යටතේ සම්පාදිත ව හෝ සම්පාදිත ලෙස සලකන ලද, මේ ආඥාපනත වලංගු වීමේ දී බලපවත්වමින් තිබුණු සෑම ප්‍රකාශනයක්, රීතියක්, දැන්වීමක්, අතුරු ව්‍යවස්ථාවක් සහ පොදු නියෝගයක් ම මේ ආඥාපනත සම්මත නොවූ කාලයක පරිදි තවදුරටත් වලංගු ව පවත්වන්නේ ය. එසේ ම, ඒවා මේ ආඥාපනත යටතේ ම සාදන ලද ඒවා ලෙස වලංගු ව පවතිනවා පමණක් නොව මේ ආඥාපනත යටතේ අවලංගු කිරීමට, වෙනස් කිරීමට හෝ වෙනත් අයුරකින් සලකනු ලැබීමට ද හැකි ය. එසේ ම, මේ ආඥාපනත වලංගු වීමෙන් පසුව ඒවාට අවනත නො වීම හෝ ඒවා කඩ කිරීම සම්බන්ධයෙන් වරදකරු වන කවර පුද්ගලයකුට වුව ද, මේ ආඥාපනත යටතේ සාදන ලද ව්‍යවස්ථාවකට, අතුරු ව්‍යවස්ථාවකට හෝ පොදු නියෝගයකට අවනත නො වීම හෝ එවැනි කඩ කිරීම සම්බන්ධයෙන් දඬුවම් පමුණුවක ආකාරයෙන් ම දඬුවම් පැමිණ විය හැකි ය. *දැනට තිබෙන ප්‍රකාශන, රීති, දැන්වීම්, අතුරු ව්‍යවස්ථා ආදිය අවලංගු කරන තෙක් වලංගු බව.*

**3**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ ආඥාපනතේ- *අර්ථ නිරූපණය.*

"පරිපාලන ප්‍රදේශය" යන්නෙන්, පළාත් පාලන (පරිපාලන ප්‍රදේශ) ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ විස්තර කරන ලද පරිපාලන ප්‍රදේශයක් ද;

"පෞද්ගලික සුසානය" යන්නෙන්, මේ ආඥාපනත වලංගු වන අවස්ථාවේ දී, මියගිය වුන් වැළලීම හෝ ආදාහනය කිරීම සඳහා පාවිච්චි කරන ලද්දා වූ හෝ මියගිය වුන් වැළලීම හෝ ආදාහනට කිරීම සඳහා III වන පරිච්ඡේදයේ විධිවිධාන යෙදී ඇති පරිදි නැතහොත් එයින් පසුව අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද්දා වූ (පොදු සුසානයක් නොවන) කිසියම් ඉඩමක් හෝ භූමියක් ද;

"පොදු සුසානය" යන්නෙන්, 1862 අංක 12 දරන ආඥාපනතේ හෝ මේ ආඥාපනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද පොදු සුසානයක් ද;

"නිසි බලධරයා" යන්නෙන්, මහා නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් ද,

අදහස් වේ.

**4**. මේ ආඥාපනත යටතේ සාදනු ලැබ නිකුත් කරනු ලබන සියලු ප්‍රකාශන, රීති, දැන්වීම්, අතුරු ව්‍යවස්ථා හා පොදු නියෝග, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ප්‍රකාශන ආදිය ගැසට් පත්‍රයේ පළ කළ යුතු බව.

## II වන පරිච්ඡේදය

### පොදු සුසාන

**5**. (1) සුදුසු යයි තමාට හැඟෙන යම් අවස්ථාවක අමාත්‍යවරයා විසින්, නිශ්චිතව සඳහන් කරන විස්තරයක හා සීමා ඇතුළත, මළවුන් වැළලීම හෝ ආදාහන කිරීම පිණිස පොදු සුසානයක් පිහිටුවීමට නියෝගයක් නිකුත් කළ හැකි ය. එසේ ම ඒ ආකාරයෙන් ම නිකුත් කරනු ලබන නියෝගයක් මගින් මීට පෙර පිහිටුවන ලද හෝ මෙයින් පසුව පිහිටුවන ලද සුසානයක භූමි ප්‍රමාණය වැඩි කිරීමට, අඩු කිරීමට හෝ වෙනත් ආකාරයකින් වෙනස් කිරීමට අමාත්‍යවරයාට හැකි ය.

පොදු සුසාන පිහිටුවීම අමාත්‍යවරයාට කළ හැකි බව.

(2) ඉහත ආකාරයෙන් සුසානයක් පිහිටුවනු ලැබූ සෑම අවස්ථාවක දී ම, නියෝගයක් නිකුත් කරමින් එහි සඳහන් කරනු ලබන කාලසීමාවෙන් පසුව, ඒ සීමාව ඇතුළත පිහිටි සෑම ප්‍රසිද්ධ සුසානයක ම හෝ පුද්ගලික සුසානයක හෝ කිසියම් පොදු සුසානයක හෝ පුද්ගලික සුසානයක මිනී වැළලීම හෝ ආදාහන කිරීම සම්පූර්ණයෙන් හෝ මඳ වශයෙන් තහනම් කිරීමට අමාත්‍යවරයාට හැකි ය.

වෙනත් තැන්වල මිනී වැළලීම තහනම් කිරීම.

(3) ඊට ප්‍රථම හෝ පසුව පිහිටුවන ලද කවර හෝ පොදු සුසානයක් වුව ද සම්පූර්ණයෙන් හෝ එහි කොටසක්, 10 වන, 15 වන, 16 වන සහ 23 වන වගන්ති සියල්ල ම හෝ ඉන් කිසියම් වගන්තියක් අදාළ නො වන පරිදි නිදහස් කිරීමටත්, එවැනි නිදහස් කිරීමක් කලින් කල ඉවත් කිරීමටත් හෝ සංශෝධනය කිරීමටත් අමාත්‍යවරයාට හැකි ය. එවැනි කිසියම් නිදහස් කිරීමක් ඉවත් කර ගැනීම හෝ සංශෝධනය කිරීම ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කළ යුතු ය.

ආඥාපනතේ ඇතැම් කොටස් අදාළ වීමෙන් සුසාන නිදහස් කළ හැකි බව.

**6**. යම් පළාත් පාලන ආයතනයක සීමාව ඇතුළත දී මිය යන තැනැත්තන්ට භූමදාන කිරීම හෝ ආදාහන කිරීම සඳහා පොදු සුසානයක් පිහිටුවීමේ කාර්යය සඳහා හෝ මීට ප්‍රථම හෝ පසුව පිහිටුවනු ලැබූ කිසියම් සුසානයක භූමි ප්‍රමාණයට එකතු කිරීම ඉඩම් සැපයීම ඒ පළාත් පාලන ආයතනයේ යුතුකම විය යුතු ය.

සුසාන භූමිවල කාර්යය සඳහා ඉඩම් සැපයිය යුතු බව.

**7**. මිය ගිය තැනැත්තන් භූමදාන කිරීම සඳහා වෙන් කොට තිබී හෝ විශේෂයෙන් වෙන් කොට තිබී, 1862 අංක 12 දරන ආඥාපනතේ හෝ මේ ආඥාපනතේ විධිවිධාන යටතේ මෘතදේහ භූමදාන කිරීම නතර කර ඇති කවර හෝ ඉඩමක් වුව ද, අමාත්‍යවරයාගේ අවසරය නොමැති ව විකිණීම, කැමැත්තක් කිරීම හෝ සෙසු කිසියම් කාර්යයක් සඳහා යෙදවීම හෝ නො කළ යුතු ය. එසේ ම කලින් සඳහන් කර ඇති පරිදි අවසරයක් නොමැති ව කරන ලද සෑම විකිණීමක් මෙන්ම වෙනත් ආකාරයේ දෙයක් කිරීම ද නිෂ්ප්‍රභ විය යුතු ය. තව ද, එවැනි කවර ඉඩමක් වුව ද අමාත්‍යවරයාගේ අවසරයක් නොමැති ව පාවිච්චි කරන කවර තැනැත්තකු වුව ද වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසකට නො අඩු සහ රුපියල් පන් දහසක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

අත්හරින ලද සුසාන පිළිබඳ ඉඩම් විකිණීම තහනම් කර ඇති බව.
[§ 2, 2005 අංක 12]

**8**. කිසියම් නිවාසයක අයිති කරුගෙන් හෝ බදු කරුගෙන් හෝ පදිංචි කරුගෙන් ලියවිල්ලකින් ලැබූ අවසරයක් ඇත්තේ නම් මිස, කවර හෝ පොදු සුසානයක කිසිම කොටසක්, කවර හෝ නිවාසයකට අඩි පනහකට වඩා කිට්ටු වන සේ පිහිටුවීම නො කළ යුතු ය.

පොදු සුසාන ගෙවල්වලට දුරින් පිහිටිය යුතු බව.

**9**. භූමදාන කිරීමේ දී හෝ ආදාහන කිරීමේ දී පවත්වනු ලබන ආගමික මෙහෙය සිදු කිරීම සඳහා, සුසානයේ සීමාව ඇතුළත පල්ලි ආදිය ගොඩ නැංවීමට බලය දීමට නිසි බලධරයාට හැකි ය.

පල්ලි ආදිය තැනිය හැකි බව.

**10**. සෑම පොදු සුසානයක ද, සෑම පොදු සුසානයක ආදාහනය සඳහා වෙන් කර තිබෙන සෑම කොටසක ද, යටත් පිරිසෙයින් අඩි හයකට නො අඩු උසකින් යුතු ස්ථිර ප්‍රාකාරයකින් හෝ යකඩ වැටකින් කොටු කළ යුතුවාත් හැර එම ප්‍රාකාරය හෝ වැට සෑම විටම අලුත්වැඩියා කර තිබිය යුතු ය.

පොදු සුසාන වට කොට තිබිය යුතු බව.
[§ 3, 1931 අංක 7]

**11**. (1) කිසියම් ප්‍රසිද්ධ සුසානයක කවර කොටසක් වුව ද, එය කිසියම් ආගමික නිකායක් විසින් ඉල්ලා සිටි විට, ඒ ආගමික නිකායේ විශේෂ ප්‍රයෝජනය සඳහා එය විකිණීමට නිසි බලධරයාට හැකි ය. එසේ විකුණන ලද කොටස, මේ ආඥාපනතෙහි අවශ්‍යතා සම්බන්ධයෙන් පමණක්, යථෝක්ත භූමිය භාරව සිටි බලධරයා විසින් ඒ ආගමික නිකාය වෙනුවෙන් ඔප්පුවක් මගින් ඒ කොටස පවරා දෙනු ලැබූ හෝ මෙයින් පසුව ඒ කොටස පවරා දෙනු ලබන තැනැත්තා හෝ තැනැත්තන් වෙත පැවරී තිබිය යුතු ය.

ප්‍රසිද්ධ සුසානය වෙන් කර දීම.

(2) සාමාජිකයන් තිදෙනෙකුගෙන් හෝ වැඩි දෙනෙකුගෙන් සමන්විත පාලක මණ්ඩලයක් පත් කිරීමට භාරකාරයන් ලෙස ක්‍රියා කරන තැනැත්තාට හෝ තැනැත්තන්ට නීත්‍යානුකූල බලය තිබිය යුතු ය. එසේ ම එවැනි කොටසක, පහත දැක්වෙන බලතල ක්‍රියාවේ යෙදවීමට ඒ පාලක මණ්ඩලයට හෝ එහි සාමාජිකයන් වැඩි දෙනාට හෝ හැකි ය-

භාරකාරයන් විසින් පාලක මණ්ඩලයක් පත් කළ හැකි බව.

(අ) ආරක්ෂකයකු ද, මිනී වළවල් භාරන්නකු ද කිසියම් පොදු සුසානයක එවැනි කොටසක් පිළිබඳ ආරක්ෂාව හා ප්‍රයෝජනය සඳහා අවශ්‍ය වන වෙනත් සේවකයන් ද පත් කිරීමේ බලය;

භාරකාර මණ්ඩලයේ බලතල.

(ආ) එවැනි කොටසක කවර බිම් කට්ටියක හෝ කට්ටිවල වැළලීමේ විශේෂ අයිතිවාසිකමක් හෝ එහි එක් වැළලීම් එකක් හෝ වැඩි ගණනක් කිරීමේ

අයිතිවාසිකම හෝ කිසියම් මිනී වළක් මත සිහිවටනයක් හෝ සොහොන් ගලක් තැන්පත් කිරීමේ අයිතිවාසිකම හෝ එවැනි කොටසක පිහිටි ගොඩනැගිල්ලක හෝ දේවස්ථානයක බිත්තිවල ස්මරණ සටහනක් කෙටීමේ අයිතිවාසිකම හෝ ප්‍රදානය කිරීමේ බලය;

(ඇ) එවැනි කවර කොටසක වුව ද ආදාහන කිරීම තහනම් කිරීමේ බලය ද වේ.

මේ වගන්තිය යටතේ දෙනු ලබන සෑම අවසර දීමනාවක් ම, ඒ යම් පාලක මණ්ඩලයක සාමාජිකයකු විසින් හෝ ඒ පාලක මණ්ඩලය මගින් පත් කරන ලද ආරක්ෂක විසින් සාක්ෂි කාරයන් එක් කෙනෙකු හෝ වැඩි දෙනෙකු ඉදිරියේ අත්සන් තැබූ ලියවිල්ලකින් දිය යුතුවාත් හැර අමාත්‍යවරයාගේ අනුමතය සහිත ව ඒ පාලක මණ්ඩලය මගින් තීරණය කළ යුතු ගාස්තුවක් හෝ ගාස්තු අය කිරීමෙන් පසුව ඒ අවසරය නිකුත් කළ යුතු ය.

(3) 22 වන වගන්තියේ විධිවිධාන යටතේ පොදු සුසාන පාලකට ගෙවිය යුතු ගාස්තුවලට අමතර වශයෙන්, මේ වගන්තිය යටතේ එවැනි කොටසකට ගෙවිය යුතු ගාස්තුව පාලක මණ්ඩලයට ගෙවිය යුතුවාත් හැර ඒ මණ්ඩලය විසින් භාර ගත යුතු වන්නේ ය. තව ද එකී කොටස නිසි ආකාරයෙන් පවත්වා ගෙන යාම පිණිස එකී මණ්ඩලය විසින් ඒ මුදල යෙදවිය යුතු ය.

(4) 16 වන වගන්තිය යටතේ නිසි බලධරයකු විසින් පත් කරන ලද කිසියම් පොදු සුසාන පාලකයකුට 23 වන වගන්තිය මගින් පැවරී ඇති යුතුකම්වලින් නිදහස් වීමට, මෙහි සඳහන් කිසිවක් හේතු නො විය යුතු ය. එහෙත් කිසියම් ආගමික නිකායක් සඳහා එවැනි සුසානයකින් වෙන් කර ඇති කිසියම් කොටසක් 20 වන වගන්තිය යටතේ ප්‍රදාන කිරීමේ ඔප්පුවක් එවැනි පාලකයකු විසින් අත්සන් නො කළ යුතු ය.

**12**. පොදු සුසානයේ කිසිදු කොටසක්, සුසානයක කටයුතුවලින් බැහැර වූ කිසිම කටයුත්තක් සඳහා පාවිච්චි නො කළ යුතු ය. මළවුන් වැළලීම හෝ ආදාහනය කිරීමත්, එවැනි වැළලීමක් හෝ ආදාහනය කිරීමක් හා සම්බන්ධ වූ කටයුතුවලින් බාහිර වූ සෙසු කිසියම් එවැනි ඉඩමක් පාවිච්චි කරන කවර තැනැත්තකු වුව ද වරදකට වරදකරු වන අතර, වරදකරු කිරීමෙන් පසු ව එවැනි එක් වරදකට රුපියල් දෙදහසකට නො අඩු සහ රුපියල් පන්දහසක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

පොදු සුසාන වැළලීම් සඳහා පමණක් ම පාවිච්චි කළ යුතු බව.
[§ 2, 2005 අංක 12]

**13**. මියගිය කිසියම් තැනැත්තකුගේ අන්තිම කැමති පත්‍රයක බූදල් බල කාරයකු විසින් ආරාධිත ව හෝ මියගිය කිසියම් තැනැත්තකුගේ මෘතදේහය භාරව සිටින සෙසු කිසියම් තැනැත්තකු විසින් ආරාධිත ව හෝ ආගමික නිකායක පූජකවරයකු, ආගමික දේව ගැතියකු, පූජකයකු හෝ වෙනත් තැනැත්තකුට ආගමික මෙහෙය සිදු කළ හැකි ය.

ආගමික නිකායක පූජ්‍යයකුට ආගමික මෙහෙය සිදු කළ හැකි බව.

**14**. කවර හෝ පොදු සුසානයකට අයත් කිසියම් ස්ථානයක භූමදාන කරන ලද මෘතදේහයක්, ඒ සුසානයේ සීමාව ඇතුළත අධිකරණ බලය ඇති දිසා අධිකරණයේ බලයක් ඇත්තේ නම් මිස ඉවත් නො කළ යුතු ය.

බලයක් නොමැතිව මෘත දේහය ඉවත් නො කළ යුතු බව.

**15**. මින් මතු සඳහන් වන, පොදු සුසානයක පාලක විසින් ඒ කාර්යය සඳහා තබා ගත යුතු ලේඛනයක, සෑම භූමදානයක් හා සෑම ආදාහනයක් ම සටහන් කළ යුතු

භූමදාන ලියා පදිංචි කළ යුතු බව.

ය. එසේ ම, 11 වන වගන්තියේ විධිවිධාන යටතේ පාලක මණ්ඩලයක් මගින් ආරක්ෂකයකු පත් කර ඇති අවස්ථාවක දී ඒ ආරක්ෂකයා විසින් සටහන් කළ යුතු ය. තවදුරටත් එසේ ම, එවැනි ලේඛන හෝ පොත් නැතහොත් ඒවායේ සහතික කරන ලද උධෘත කොටස්, එවැනි භූමදාන හා ආදාහන සම්බන්ධයෙන් ප්‍රත්‍යක්ෂ සාක්ෂි වශයෙන් ඕනෑම අධිකරණයක දී ආවේශ්‍ය විය යුතු ය. තව ද එවැනි කාර්යයක් සඳහා කලින් කල අමාත්‍යවරයා විසින් පත් කළ යුතු නිලධරයා වෙත ඒවායේ පිටපත් හෝ ලිඛිත පිටපත් යැවිය යුතු ය.

**16**. පොදු සුසානයක් සඳහා පාලකයකු, වළවල් හාරන්නන් හා ආරක්ෂාව හා ප්‍රයෝජනය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් සේවකයන් නිසි බලධරයා විසින් පත් කළ යුතු අතර, සුදුසු යයි ඔහුට වැටහෙන වැටුපක්, වේතනයක් හෝ දීමනාවක් ඔවුන්ට ගෙවීමට ද ඔවුන් හෝ ඔවුන්ගෙන් යම් කිසිවකු ස්වකීය කැමැත්ත පරිදි සේවයෙන් ඉවත් කිරීමට ද ඔහුට හැකි ය.

පාලකයකු, වළවල් හාරන්නකු ආදීන් පත් කිරීම නිසි බලධරයා විසින් කළ යුතු බව.

**17**. පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිසි බලධරයා විසින් නියෝග සෑදිය හැකි ය-

විනීත භාවය, ගරුසරු භාවය හා මිනී වළවල්වල ගැඹුර ආදී කරුණු පිළිබඳ නියෝග සෑදීම.

(අ) පොදු සුසානයක සිදු කරන සෑම භූමදානයක් ම විනීත ලෙසත්, ගරු සරු ලෙසත් කළ යුතු බව හා මිනී වළවල් ප්‍රමාණවත් ලෙස ගැඹුරු විය යුතු බව නිශ්චිත කිරීම;

(ආ) 11 වන වගන්තිය යටතේ සුසානයක විකුණන ලද කොටස්වලින් පිටස්තර වූ කිසියම් කොටසක මෘතදේහ ආදාහනය කිරීම සඳහා වෙන් කිරීම හා එවැනි ආදාහන කළ යුතු ආකාරය විධිමත් කිරීම;

(ඇ) වැළලීමෙන් පසු නියමිත කාල සීමාවක් ඇතුළත දී මිනී වළවල් විවෘත කිරීම තහනම් කිරීම;

(ඈ) සුසාන පාලකයින්, ආරක්ෂකයන් මිනී වළවල් හාරන්නන් සතු යුතුකම්. [§ 4, 1931 අංක 7]

**18**. පොදු සුසානයක කිසියම් දේවස්ථානයක් හෝ ගොඩනැගිල්ලක් යට කිසිම ගුහාවක හෝ එවැනි දේවස්ථානයක හෝ ගොඩනැගිල්ලක පිට බිත්තියෙන් අඩි පහකට ආසන්නව හෝ කිසිම මෘත දේහයක් වැළලීම නො කළ යුතු ය. එසේ ම මේ වගන්තියේ විධිවිධානවලට පටහැණි ආකාරයෙන් කවර හෝ මෘතදේහයක් භූමදාන කරන, කරවන හෝ එසේ කිරීමට අවසර දෙන හෝ මෘතදේහයක් එසේ වළලනු ලැබීමට සලස්වන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු වන අතර වරදකරු කිරීමෙන් පසු රුපියල් තුන් දහසකට නො අඩු සහ රුපියල් පන්දහසක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

දේවස්ථාන හෝ ගොඩනැගිලි තුළ හෝ ඒවාට ආසන්නව මිනී වැළලීම නොකළ යුතු බව.
[§ 2, 2005 අංක 12]

**19**. (1) මේ ආඥාපනතේ 11 වන වගන්තිය යටතේ විකුණන ලද කොටස්වලට ඇතුළත් නොවූ පොදු සුසාන භූමියක කොටස්, විකිණීමට හෝ අමාත්‍යවරයාගේ අනුමැතිය ඇති ව, නිසි බලධරයා විසින් තමාට සුදුසු යයි හැඟෙන කොන්දේසිවලට ද අනුකූල ව, එවැනි කිසියම් කොටසක භූමදාන කිරීමේ විශේෂ අයිතිවාසිකම හෝ එක එක භූමදානයක් හෝ ඊට වැඩි ගණනක් කිරීමේ අයිතිවාසිකම සදාකාලිකව හෝ සීමාසහිත කාලයකට නොමිලයේ ප්‍රදානය කිරීමට හෝ හැකි ය. එසේ ම, 11 වන වගන්තිය යටතේ විකුණන ලද කොටසකට ඇතුළත් නොවූ සුසානයේ කවර කොටසක වුව ද කිසියම් ස්මාරකයක් හෝ සොහොන් ගලක් පිහිටුවීමේ

පොදු සුසානයේ ඇතැම් කොටස් විශේෂ භූමදාන සඳහා වෙන් කර තැබිය හැකි බව.

අයිතිවාසිකම හෝ එවැනි කිසියම් කොටසක් ඇතුළත පිහිටි දේවස්ථානයක හෝ ගොඩනැගිල්ලක කිසියම් පුවරුවක් හෝ අනුස්මරණ සටහනක් පිහිටුවීමේ අයිතිවාසිකම විකිණීමට හෝ ප්‍රදානය කිරීමට ද ඔහුට හැකියාව තිබිය යුතු ය.

(2) 11 වන වගන්තියේ විධිවිධාන යටතේ සුසානයේ කිසියම් කොටසක් හෝ කොටස් විකිණීමෙන් හෝ මේ වගන්තියේ විධිවිධාන යටතේ කරනු ලබන කිසියම් විකිණීමකින් හෝ ලැබෙන සියලුම මුදල්, ඒ සුසාන භූමිය ඇතුළත් වන පළාත් පාලන ආයතනයේ අරමුදලට බැර කළ යුතු ය.

**භූමදාන කිරීමේ විශේෂ අයිතිවාසිකමක් ප්‍රදානය කිරීමේ ආකෘතිය.**

**20**. 19 වන වගන්තිය යටතේ සුසානයේ කවර ස්ථානයක වුව ද භූමදාන කිරීමේ විශේෂ අයිතිවාසිකම ද, ඒ ස්ථානයේ භූමදාන එකක් හෝ වැඩි ගණනක් සිදු කිරීමේ අයිතිවාසිකම ද, නැතහොත් ස්මාරකයක්, පුවරුවක් හෝ සොහොන් ගලක් තැන්පත් කිරීමේ අයිතිවාසිකම ද, උප ලේඛනයේ දැක්වෙන "අ" හෝ "ආ" යන ආකෘති දෙකෙන් එකක ආකාරයෙන් හෝ ඊට සමානව කළ යුතු අතර, එය සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරියේ සුසාන පාලක විසින් කළ යුතු ය.

**ප්‍රදාන පිළිබඳව ලේඛනයක් තබා ගත යුතු බව.**

**21**. (1) එවැනි සෑම ප්‍රදානයක් ම සටහන් කරන ලේඛනයක් සුසාන පාලක විසින් තබා ගත යුතු අතර, ඒ ප්‍රදානය සිදු කළ දිනයත්, ඒ සම්බන්ධ වූ පක්ෂත්, එසේ ම ඒ ප්‍රදානය සම්බන්ධයෙන් මුදල් අය කිරීමක් වී නම් එය ද, ඒ ප්‍රදානයෙහි විස්තර කර ඇති භූමිය හඳුනා ගැනීමට හැකි වන පරිදි ඒ පිළිබඳ ව විස්තරයක් ද ඇතුළත් සිහිවටන සටහනක්, යථෝක්ත ප්‍රදානය සිදු කර දින දාහතරක් ඇතුළත ඒ සුසාන පාලක විසින් එකී ලේඛනයේ සටහන් කළ යුතු ය.

එසේ වුව ද, 1862 අංක 12 දරන ආඥාපනත යටතේ සුසානයක කොටසක් මීට ප්‍රථම වෙන් කර තබා ඇති විටෙක හෝ ඊට පසුව 11 වන වගන්තිය යටතේ කිසියම් ආගමික නිකායක විශේෂ ප්‍රයෝජනය සඳහා වෙන් කර විටෙක, ඒ කොටස සම්බන්ධයෙන් තබා ගනු ලබන ලේඛනය, යථෝක්ත වගන්තිය යටතේ පත් කරන ලද ආරක්ෂකයා විසින් තැබිය යුතු ය.

(2) එවැනි එක් එක් සටහනක් සඳහා, නිසි බලධරයාගේ අභිමතය අනුව සුදුසු යයි හැඟෙන රුපියලකට නො වැඩි මුදලක් යථෝක්ත අවසරය දෙනු ලැබූ තැනැත්තාගෙන් අය කිරීමට සුසාන පාලකට බලය තිබිය යුතු ය. එසේ ම ශත පනහක මුදලක් ගෙවීමෙන් පසු සුසාන පාලක විසින් පවත්වා ගෙන යනු ලේඛනය, සෑම සාධාරණ වේලාවක ම යථෝක්ත අවසරය ලැබූ තැනැත්තාට හෝ ඒ අයිතිවාසිකම පවරා දෙනු ලැබූ තැනැත්තාට පරීක්ෂා කර බැලීම සඳහා ඉඩ දිය යුතු ය.

**ගාස්තු ආදිය සඳහා නිසි බලධරයා විසින් නියෝග සෑදිය යුතු බව.**

**22**. (1) සුසාන පාලකට ගෙවිය යුතු ගාස්තු සඳහා ද, කිසියම් ආගමික නිකායක විශේෂ ප්‍රයෝජනය සඳහා විකුණනු නො ලැබූ හෝ වෙන් නො කරන ලද සුසානයේ කිසියම් කොටසක භූමදාන පිළිබඳ ආගමික මෙහෙයක් සම්බන්ධයෙන් ගාස්තු සඳහා ද සුසානයේ කෙරෙන එවැනි වෙනත් මෙහෙයවල් සඳහා ද ස්වකීය පාලන සීමා ඇතුළත පිහිටි සුසාන සම්බන්ධයෙන් නිසි බලධරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) කිසියම් ආගමික නිකායක විශේෂ ප්‍රයෝජනය සඳහා විකුණන ලද හෝ වෙන් කරන ලද සුසානයේ කිසියම් කොටසක් සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු,

11 වන වගන්තියේ විධිවිධාන යටතේ ඒ කොටස වෙනුවෙන් පාලක මණ්ඩලයට ගෙවිය යුතු ගාස්තුව කුමක් වුව ද, සුසාන පාලකට ගෙවිය යුතු ය.

සුසානයේ සැලැස්ම සහ කෝශ ග්‍රන්ථය පරීක්ෂාව සඳහා තැබිය යුතු බව.

**23**. සුසානයේ භූමදාන සඳහා වෙන් කර තිබෙන්නා වූ ද, භූමදාන කිරීමේ විශේෂ අයිතිවාසිකමක් ප්‍රදානය කොට ඇත්තා වූ ද සෑම කොටසක ම පිහිටි භූමදාන කර තිබෙන සෑම ස්ථානයක ම පිහිටීම පෙන්වීමට තරම් ප්‍රමාණවත් ලෙස විශාල වූ පරිමාණයක් අනුව සුසානයේ සැලැස්මක් සෑදීමට නිසි බලධරයා විසින් සැලැස්විය යුතු ය. එවැනි සෑම භූමදාන ස්ථානයක් ම අංකිත විය යුතු අතර, ඒ අංක සුසාන පාලක විසින් ඒ සඳහා තැබිය යුතු පොතක සටහන් කළ යුතු ය. තව ද ඒ භූමදාන කිරීමේ ස්ථානවල මෘතදේහ භූමදාන කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රදානය කර ඇති ඒ ඒ තැනැත්තන්ගේ නම් හා විස්තර ඒ ආකාරයේ පොතක අන්තර්ගත විය යුතු ය. තව ද ඒ සැලැස්මේ සලකුණු නො කර, එසේ ම ඒ පිළිබඳ සටහනක් ඒ ආකාරයෙන් එකී ලේඛනයෙහි ඇතුළත් නො කර, භූමදාන කිරීමේ ස්ථානයක් ඒ සුසානයේ ඇති නොකළ යුතු ය. සුසාන පාලක විසින් පිළියෙල කරන ලද පූර්වෝක්ත සැලැස්ම සහ ලේඛනය, නිසි බලධරයා විසින් ඒ සඳහා නියම කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසු කවර සාධාරණ වේලාවක වුව ද මහජනයාට පරීක්ෂා කර බැලීම සඳහා ඉඩ දිය යුතු ය.

භූමදාන කිරීමේ විශේෂ බලය පවරා දෙන ආකෘති පත්‍රය හා පවරා දීම ලියාපදිංචි කළ යුතු බව.

**24**. භූමදාන කිරීමේ විශේෂ අයිතිවාසිකම හිමි කර දීමේ පැවරුම, උප ලේඛනයෙහි "ඇ" ආකෘතියෙහි ආකාරයෙන් හෝ ඊට සමාන වන ආකාරයෙන් කළ යුතු ය. එසේ ම එය සාක්ෂි කාරයන් එක් කෙනෙකු හෝ දෙදෙනෙකු කරන ලද්දේ නම් වලංගු විය යුතු ය. එවැනි සෑම පවරා දීමක් ම, ලංකාවේ දී කරන ලද නම් එය පවරා දී හය මාසයක් ඇතුළත දී ද, වෙනත් රටක කරන ලද්දේ නම්, එය ලංකාවට ලැබී හය මාසයක් ඇතුළත දී ද, සුසාන පාලක වෙත ද නැතහොත් 1862 අංක 12 දරන ආඥාපනතේ 12 වන වගන්තිය යටතේ මීට පෙර වෙන් කර තබන ලද සුසානයේ කොටසක් සම්බන්ධයෙන් හෝ මීට පසු 11 වගන්තිය යටතේ කිසියම් ආගමික නිකායක විශේෂ ප්‍රයෝජනය පිණිස විකුණන ලද කොටසක් සම්බන්ධයෙන් නම්, එවැනි ආගමික නිකායේ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය. එව ද එවැනි පවරා දීමක් පිළිබඳ ස්මරණ සටහනක්, මුලින් කරන ලද ප්‍රදානයේ සටහන ලෙසින් ම සුසාන පාලක විසින් හෝ පාලක මණ්ඩලය විසින් ලේඛනයේ ඇතුළත් කළ යුතු ය. එවැනි ස්මරණ සටහනක් කරන තෙක් එවැනි කිසියම් පවරා දීමක් යටතේ කිසිදු භූමදානයක් භාර නො ගත යුතු ය. තව ද, එවැනි ස්මරණ සටහනක් සම්බන්ධයෙන් ම, නිසි බලධරයාට සුදුසු යයි හැඟෙන රුපියලකට නො වැඩි ගාස්තුවක් අය කිරීමට සුසාන පාලකට හෝ පාලක මණ්ඩලයට බලය තිබිය යුතු ය.

කැමැත්තක් නැතිව, භූමදාන කිරීමේ විශේෂ අයිතියට අවහිර නොකළ යුතු බව.

**25**. වැළලීමේ විශේෂ අයිතිවාසිකම ප්‍රදානය කර ඇති කවර හෝ තැනක, ඒ අවස්ථාවේ දී භූමදාන කිරීමේ ඒ විශේෂ අයිතිය ඇති තැනැත්තාගේ කැමැත්ත ඇත්තේ නම් මිස, කවර හෝ මෘතදේහයක් භූමදාන නො කළ යුතු ය.

නුසුදුසු ලෙස ගොඩනැංවූ ස්මාරක ඉවත් කිරීම.

**26**. 11 වන වගන්තිය යටතේ විකුණන ලද සුසානයේ කිසියම් කොටසක නම් පාලක මණ්ඩලයේ ද, සුසානයේ වෙනත් කිසියම් කොටසක නම් නිසි බලධරයාගේ ද බලය නොමැති ව ගොඩ නංවන ලද කිසියම් සොහොන් කොතක්, ස්මාරකයක්,

පුවරුවක් හෝ කොටන ලද ස්මරණ සටහනක් එය තිබූ තැනින් ගලවා ඉවත් කිරීමට පිළිවෙළින් පාලක මණ්ඩලයට හෝ නිසි බලධරයාට හැකි ය.

9 වන, 11 වන සහ 19 වන වගන්තිවලින් පැවරී ඇති බලතල ක්‍රියාවේ යෙදවීම; නිසි බලධරයා ප්‍රතික්ෂේප කළ අවස්ථාවක දී ඒවා ක්‍රියාවේ යෙදවීමට අමාත්‍යවරයාට හැකි බව

**27**. කිසියම් පොදු සුසානයක සීමා ඇතුළත භූමදාන කිරීම් හෝ ආදාහන කිරීම් ආදියේ දී ආගමික මෙහෙය පැවැත්වීම සඳහා දේවස්ථානයක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් ගොඩ නැංවීමට බලය දීම හෝ කිසියම් ආගමික නිකායක විශේෂ ප්‍රයෝජනය සඳහා සුසානයේ කොටසක් ඉල්ලා සිටින ආගමික නිකායකට ඒ කොටස ප්‍රදානය කිරීමේ හෝ විශේෂයෙන් ම භූමදාන කිරීමේ අයිතිවාසිකම හෝ නිසි බලධරයා විසින් ප්‍රතික්ෂේප කරන සෑම අවස්ථාවක දී ද, නැතහොත් සුසානයක කොටසක් විකිණීම සඳහා එවැනි ආගමික නිකායකින් අධිකතර මුදලක් ඉල්ලා සිටි විට ද, එවැනි ආගමික නිකායක් විසින් ඉල්ලා සිටිය හොත්, එසේ කිරීම සුදුසු යයි හැඟී යන්නේ නම්, එවැනි සුසානයක් සම්බන්ධයෙන් 9 වන, 11 වන, සහ 19 වන වගන්තිවල විධිවිධානවලින් හෝ ඉන් කවර වගන්තියකින් හෝ නිසි බලධරයා වෙත පැවරී ඇති බලතල සියල්ල ම හෝ කිසියම් බලතලයක් අමාත්‍යවරයා විසින් පාවිච්චි කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

පොදු සුසානයකට හානි කිරීමට දඬුවම්. [§ 2, 2005 අංක 12]

**28**. කිසියම් පොදු සුසානයකට අයත් යම් ගොඩනැගිල්ලක්, බිත්තියක් හෝ වැටක් ඕනෑකමින් ම විනාශ කරන්නා වූ හෝ එවැන්නකට අනතුරු කරන්නා වූ නැතහොත් එහි ඇති කිසියම් ගසක් හෝ පැළෑටියක් විනාශ කරන්නා වූ හෝ එවැන්නකට අනතුරු කරන්නා වූ නැතහොත් එහි කිසියම් බිත්තියක් අපවිත්‍ර කරන්නා වූ නැතහොත් එහි හෝ එහි කිසියම් බිත්තියක කිසියම් දැන්වීමක් අලවන්නා වූ නැතහොත් කිසියම් පොදු සුසානයක් තුළ පිහිටුවා ඇති ස්මාරකයක්, පුවරුවක්, කොටු සටහනක් හෝ සොහොන් කොතක් ඕනෑ කමින් ම විනාශ කරන්නා වූ හෝ එවැන්නකට හානි කරන්නා වූ සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කිරීමෙන් පසු ව රුපියල් එක් දහසකට නො අඩු සහ රුපියල් පන්දහසක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

පොදු සුසානයෙහි ක්‍රීඩා පවත්වන හෝ ගිනිකෙළි පවත්වන හෝ සෙසු කරදරකාරී වැඩක යෙදෙන තැනැත්තන්ට දඬුවම්. [§ 2, 2005 අංක 12]

**29**. කවර හෝ පොදු සුසානයක වුව ද කිසියම් ක්‍රීඩාවක හෝ කෙළි සෙල්ලමක යෙදෙන්නා වූ හෝ යුද්ධ අවමංගල්‍යයක දී හැර ගිනි අවි පාවිච්චි කරන්නා වූ සෑම තැනැත්තකු ම ද, නැතහොත් මෘතදේහයක් භූමදාන කිරීම හෝ ආදාහන කිරීම සඳහා සුසානයට රැස් වූ කිසියම් තැනැත්තකුට ඕනෑ කමින් ම හෝ නීති විරෝධි ලෙස කරදර ඇති කරන සෑම තැනැත්තකු ම ද, නැතහොත් කිසියම් සුසානයක් ඇතුළත කිසියම් කලබලකාරී දෙයක් කරන සෑම තැනැත්තකු ම ද, වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කිරීමෙන් පසු ව රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් දෙදහසක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

නියෝග කඩ කිරීම. [§ 2, 2005 අංක 12]

**30**. මේ ආඥාපනත යටතේ සාදන ලද කිසියම් නියෝගයක් කඩ කරන කවර හෝ තැනැත්තකු වුව ද, වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කිරීමෙන් පසු ව රුපියල් එක් දහසකට නො අඩු සහ රුපියල් තුන් දහසක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

## III වන පරිච්ඡේදය

### පුද්ගලික සුසාන

“පොදු පූජා ස්ථානය” යන්නෙහි අර්ථ නිරූපණය.

**31**. මේ පරිච්ඡේදයෙහි “පොදු පූජා ස්ථානය” යන්නෙන්, සියලු ම දෙව් මැදුරු, පල්ලි, සියලු ම වර්ගයේ පන්සල්, සියලු ම වර්ගයේ මුස්ලිම් පල්ලි සහ සුසානයේ භූමදානයක් කිරීමේ දී ආගමික මෙහෙය සඳහා විශේෂයෙන් පාවිච්චි කරනු ලබන ඒ සඳහා සුසානයෙහි ඉදි කරවන ලද දේවස්ථාන හැර සෙසු දේවස්ථාන ද ඇතුළත් විය යුතු ය.

පොදු පූජාස්ථාන ආදියෙහි භූමදාන කිරීම තහනම් කර ඇති බව.
[§ 2, 2005 අංක 12]

**32**. කවර හෝ පොදු පූජා ස්ථානයක හෝ ඒ හා සම්බන්ධ වූ විස්තර කරන ලද කිසියම් භූමි ප්‍රමාණයක් ඇතුළත, නියෝගයක සඳහන් දිනයේ සිට කිසියම් මෘත දේහයක් හෝ දෙණක් වැළලීම හෝ ආදාහනය කිරීම නීත්‍යානුකූල නොවන බව ප්‍රකාශ කරමින් අමාත්‍යවරයා විසින් කලින් කල නියෝග සෑදිය හැකි ය. එවැනි නියෝගයක සඳහන් කාලයෙන් පසු, මේ වගන්තියේ විධිවිධානවලට පටහැනි වන ආකාරයෙන් කිසියම් මෘතදේහයක් හෝ දෙණක් වළලන්නා වූ හෝ ආදාහනය කරන්නා වූ නැතහොත් මෘතදේහයක් හෝ දෙණක් වැළලීම හෝ ආදාහනය කරවන්නා වූ, අවසර දෙන්නා වූ හෝ සලස්වන්නා වූ සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කිරීමෙන් පසු ව රුපියල් එක් දහසකට නො අඩු සහ රුපියල් තුන් දහසක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

අලුත් පුද්ගලික සුසාන අමාත්‍යවරයා විසින් අනුමත කළ යුතු බව.

**33**. නිසි බලධරයාගේ නිර්දේශ ඇති ව, අමාත්‍යවරයා විසින් අනුමත කරනු නො ලැබූ කිසිදු ස්ථානයක අලුතෙන් පුද්ගලික සුසාන ඇති කිරීම හෝ පාවිච්චි කිරීම නො කළ යුතු ය. එවැනි අනුමත කිරීමක් ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් ප්‍රකාශයට පත් කළ යුතු ය. අලුත් පුද්ගලික සුසානයක් සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම් පත්‍රයක් සමගම බලයලත් මිනින්දෝරුවකු විසින් සාදන ලද, ඒ පුද්ගලික සුසානයේ පිහිටීම පැහැදිලි ලෙස පෙන්වන සැලැස්මක් ද විය යුතු ය.

පුද්ගලික සුසානවල භූමදාන හා ආදාහන කිරීම නැවැත්වීම.

**34**. නිසි බලධරයා විසින් කරුණු දැක්වීමෙන් අනතුරුව, කවර හෝ ස්ථානයක පිහිටි පුද්ගලික සුසානයක්, ඒ ස්ථානයේ වාසය කරන තැනැත්තන්ගේ සෞඛ්‍යයට හානිකර තත්ත්වයකින් හෝ වටපිටාවකින් පවතින්නේ යයි අමාත්‍යවරයාට පෙනී යන්නේ නම්, ඒ කවර පුද්ගලික සුසානයක් වුව ද නියෝගයක සඳහන් කාලයෙන් පසුව භූමදාන හෝ ආදාහන කිරීම නතර කළ යුතු යයි අමාත්‍යවරයා විසින් නියෝග කිරීම නීත්‍යානුකූල විය යුතු ය. එවැනි සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කළ යුතු ය.

පුද්ගලික සුසානවල භූමදාන හෝ ආදාහන නැවැත්වීමේ නියෝගයකින් පසුව එසේ නො කළ යුතු බව.
[§ 2, 2005 අංක 12]

**35**. ඒ නියෝගයෙහි සඳහන් කර ඇති කාලයට පසු, එහි සඳහන් කර ඇති කවර හෝ පුද්ගලික සුසානයක මෘතදේහයක් භූමදාන කිරීම හෝ ආදාහන කිරීම නීත්‍යානුකූල නො විය යුතු ය. තව ද ඒ නියෝගයෙහි සඳහන් කාලයෙන් පසුව, ඒ නියෝගයට පටහැණි ආකාරයෙන් මෘතදේහයක් භූමදාන කරන්නා වූ හෝ ආදාහන කරන්නා වූ හෝ භූමදාන හෝ ආදාහන සිදු කරවන්නා වූ, ඊට අවසර දෙන්නා වූ හෝ ඊට ඉඩ සලස්වන්නා වූ නැතහොත් භූමදාන කිරීමට හෝ ආදාහන කිරීමට සහාය වන්නා වූ සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කිරීමෙන් පසු ව රුපියල් එක් දහසකට නො අඩු සහ රුපියල් තුන් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

පුද්ගලික සුසාන කොටුකර තැබිය යුතු හා කැලෑවෙන් එළි පෙහෙළි කර තැබිය යුතු බව.

**36**. කවර පුද්ගලික සුසානයක් වුව ද, නිසි බලධරයා විසින් තමන්ට ප්‍රමාණවත් යයි තීරණය කරන කාලසීමාවක් ඇතුළත කොටු කරන ලෙසත්, එහි වැවී තිබෙන කැලෑ හෝ වල් පඳුරු එළි කරන ලෙසත්, ඒ සුසානයේ භාරකාරයන්ට, කළමනාකරුවන්ට හෝ අයිතිකාරයන්ට ද නැතහොත් එය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් භාරව සිටින තැනැත්තන්ට නියම කිරීමට නීත්‍යානුකූල බලය තිබිය යුතු ය. එසේ කරනු ලබන නියමයක් අනුව කටයුතු නො කරන්නේ නම්, එකී පුද්ගලික සුසානයේ එකී භාර කරුවන්ගේ, කළමනාකරුවන්ගේ හෝ අයිතිකරුවන්ගේ හෝ එය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් භාරව සිටින තැනැත්තන්ගේ වියදමින් එය නිසියාකාර කොටු කරවන්නට හෝ එහි වැවී ඇති කැලෑ හෝ වල් පඳුරු එළ කරවන්නට හෝ නිසි බලධරයාට බලය තිබිය යුතු ය.

බලයක් නැතිව පුද්ගලික සුසානයකින් මෘතදේහයක් ආපසු ගෙන යා නොහැකි බව.
[§ 2, 1937 අංක 14]

**37**. කිසියම් පුද්ගලික සුසානයක් පිහිටා ඇති ප්‍රදේශයේ අධිකරණ බලය ඇති දිසා අධිකරණයෙන් දුන් බලයක් නොමැති ව ඒ පුද්ගලික සුසානයේ කවර කොටසක හෝ භූමදාන කරන ලද මෘතදේහයක් එය තිබූ තැනින් ආපසු ගෙන යාම නො කළ යුතු ය.

එසේ වුව ද, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 365 වන වගන්තියේ විධිවිධානවලට මේ වගන්තියේ කිසිවකින් කිසිම වෙනසක් හෝ සීමා කිරීමක් සිදු නො විය යුතු ය.

අතුරු ව්‍යවස්ථා.

**38**. පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිසි බලධරයා විසින් කලින් කල අතුරු ව්‍යවස්ථා සෑදීම නීත්‍යානුකූල විය යුතු ය-

(අ) පුද්ගලික සුසාන පරීක්ෂා කිරීම;

(ආ) එවැනි සුසානවල භූමදාන කිරීම හා ආදාහන කිරීම නිසි ආකාරයෙන් විධිමත් කිරීම මිනී වළවල් නිසි ගැඹුරින් යුක්ත කරවීම;

(ඇ) නියමිත ප්‍රදේශයක් ඇතුළත පිහිටි පුද්ගලික සුසානවල සීමා ද විස්තර කරමින් ඒවා ලියා පදිංචි කිරීම;

(ඈ) සාමාන්‍ය වශයෙන් සියලු ම පුද්ගලික සුසාන නිසියාකාර පාලනය කිරීම, විධිමත් කිරීම, ආරක්ෂා කිරීම හා සීමා කිරීම සහ එහි සීමා ඇතුළත නිශ්ශබ්දතාව, අලංකාර බව හා පිරිසිදු බව ආරක්ෂා කිරීම.

තව ද කවර වේලාවක දී වුව ද, අවලංගු කළ හැකි, වෙනස් කළ හැකි හෝ සංශෝධනය කළ හැකි අන්දමේ අතුරු ව්‍යවස්ථා ද සෑදිය හැකි ය.

අතුරු ව්‍යවස්ථා අමාත්‍යවරයා විසින් අනුමත කළ යුතු බව.

**39**. ඒ අතුරු ව්‍යවස්ථා වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට හෝ සුදුසු යයි අදහස් කරන ආකාරයට ඉඩ නො දී සිටීමට නැතහොත් ඒවා අවලංගු කිරීමකට, වෙනස් කිරීමකට හෝ සංශෝධනය කිරීමකට බලය තිබිය යුතු අතර ඒවා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තෙක් වලංගු නො විය යුතුවාත් හැර බලාත්මක ද නො විය යුතු ය. තව ද ඒ සියලු ම අතුරු ව්‍යවස්ථා ද, ඒවායේ යම් අවලංගු කිරීමක්, වෙනස් කිරීමක් හෝ සංශෝධනය කිරීමක් ද ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කළ යුතු ය.

එසේ වුව ද, එවැනි සෑම අතුරු ව්‍යවස්ථාවක් ම පාර්ලිමේන්තුව රැස් වන කාලයක් ඇතුළත දී නම්, එසේ ගැසට් පත්‍රයේ පළ කර මාසයක් ඇතුළත දී ද, පාර්ලිමේන්තුව රැස්වීම් නො පැවැත්වෙන කාලයක් ඇතුළත දී

නම් පාර්ලිමේන්තුවේ ඊළඟ රැස්වීම ආරම්භ වී මාසයක් ඇතුළත දී ද සහ එසේ කවර ආකාරයෙන් වුව ද පාර්ලිමේන්තු රැස්වීම් හතරක් ඇතුළත දී ඒවාට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබිය යුතු ය. එසේ කරන ලද ඉදිරිපත් කිරීමක දී ඒ අතුරු ව්‍යවස්ථාවලට පාර්ලිමේන්තුවේ දී නිශ්ප්‍රභ වුව හොත් ඒ කවර අතුරු ව්‍යවස්ථාවක් වුව ද අවලංගු වන අතර ඒවා බලාත්මක ද නො වන්නේ ය.

## IV වන පරිච්ඡේදය

### දණ්ඩන විධිවිධාන සහ උසාවි බලතල

ලියා පදිංචි නො කළ පුද්ගලික සුසානවල හෝ පොදු සුසානයක් නොවන තැනක භූමදාන කිරීම හා ආදාහන කිරීම තහනම් කිරීම.

**40**. විස්තර කරන ලද ප්‍රදේශ ඇතුළත පුද්ගලික සුසාන ලියා පදිංචි කිරීමේ විධිවිධාන පිළිබඳ ව වූ අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කළ දිනයේ සිට මාස තුනක් ඉකුත් වීමෙන් පසුව, මේ ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ 1862 අංක 12 දරන ආඥාපනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද පොදු සුසානයක් නොවන්නා වූ නැතහොත් ඒ යම් අතුරු ව්‍යවස්ථාවල නියම කර ඇති ආකාරයෙන් ලියා පදිංචි කරන ලද පුද්ගලික සුසානයක් නො වන්නා වූ යථෝක්ත ප්‍රදේශ ඇතුළත පිහිටි කවර හෝ තැනක කිසිම මෘතදේහයක් භූමදාන කිරීම හෝ ආදාහන කිරීම නීති විරෝධී විය යුතු ය. පෙර සඳහන් කරන ලද පරිදි මාස තුනක් ඉකුත් වීමෙන් පසුව, මේ වගන්තියේ විධිවිධානවලට පටහැණි වන ආකාරයෙන් කිසියම් මෘතදේහයක් භූමදාන කරන්නා වූ හෝ ආදාහන කරන්නා වූ නැතහොත් භූමදාන කිරීම හෝ ආදාහන කිරීම සිදු කරවන, ඊට අවසර දෙන හෝ ඊට ඉඩ සලස්වන නැතහොත් මෘතදේහයක් භූමදාන කිරීමට හෝ ආදාහන කිරීමට සහාය වන්නා වූ සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කිරීමෙන් පසු ව රුපියල් තුන් සියයක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

එසේ වුව ද, මේ ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ 1862 අංක 12 දරන ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ පිහිටුවන ලද පොදු සුසානයක් නො වන්නා වූ ද, එවැනි අතුරු ව්‍යවස්ථාවක් මගින් නියමිත ආකාරයෙන් ලියා පදිංචි කරන ලද පුද්ගලික සුසානයක් නො වන්නා වූ ද, කවර හෝ සුසානයක වුව ද මෘත දේහයක් භූමදාන කිරීමට හෝ ආදාහන කිරීමට නිසි බලධරයා විසින් අවසර දීම නීත්‍යානුකූල විය යුතු ය. එසේ අවසර දෙන ලද භූමදානයක් හෝ ආදාහනයක් සම්බන්ධයෙන් මේ ආඥාපනතේ විධිවිධාන අදාළ නො විය යුතු ය.

අතුරු ව්‍යවස්ථා කඩ කිරීම වරදක් වන බව.
[§ 2, 2005 අංක 12]

**41**. මේ ආඥාපනත යටතේ සාදනු ලැබ ප්‍රසිද්ධ කළ කවර අතුරු ව්‍යවස්ථාවක් වුව ද කඩ කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කිරීමෙන් පසු ව රුපියල් දෙදහසකට නො අඩු සහ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය. තව ද ඒ වරද තවදුරටත් කර ගෙන යන අවස්ථාවක දී, එසේ ඒ වරද කරන එක් එක් දිනයට රුපියල් පන්සීයක් වන වැඩිදුර අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

වැරදි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට මහේස්ත්‍රාත් අධිකරණයට බලය ඇති බව.

**42**. මේ ආඥාපනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ පවරන ලද සියලු ම නඩු මීට පටහැණි ව අපරාධ නඩු විධාන සංග්‍රහයේ හෝ වෙනත් කිසියම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව තිබුණ ද ඒ

නඩු සම්බන්ධයෙන් මෙහි සඳහන් සම්පූර්ණ දඬුවම් නියම කිරීමට මහේස්ත්‍රාත් අධිකරණයට බලය තිබිය යුතු ය.

නඩු පැවරීම පිළිබඳ සීමා කිරීම.

**43**. කිසියම් වරදක් කර මාස තුනක් ඇතුළත ඒ පිළිබඳ ව නඩු පැවරීම ආරම්භ නොකරන ලද්දේ නම්, මේ ආඥාපනතේ විධිවිධානවලට පටහැණි වීමේ වරදකට කවර තැනැත්තකුට වුව ද විරුද්ධව නඩු පැවරිය නො හැකි විය යුතු ය.

තොරතුරු සපයන්නාට දඩයෙන් කොටසක්.

**44**. මේ ආඥාපනත යටතේ නඩු පවරනු ලැබූ යම් තැනැත්තකු වරදකරු කිරීමට පෙර, ඒ වරද පිළිබඳ තොරතුරු සැපයූ තැනැත්තාට එකී නඩුවෙන් නියම කරනු ලැබ සත්‍ය වශයෙන් ම ගෙවනු ලැබූ මුදලෙන් භාගයකට වැඩි නොවන, අධිකරණයට සුදුසු යයි වැටහෙන මුදලක් පරිත්‍යාග කිරීමට ඒ අධිකරණයට බලය තිබිය යුතු ය.

දඩ මුදල් යෙදවීම.

**45**. මේ ආඥාපනත යටතේ කරන ලද වරදක් සම්බන්ධයෙන් හෝ මේ ආඥාපනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් කඩ කිරීම සම්බන්ධයෙන් හෝ අය කරගනු ලබන සෑම දඩ මුදලක් ම, 44 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව ඒ වරද සිදු කරන ලද්දේ කවර පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාව ඇතුළත දී ද, ඒ පළාත් පාලන ආයතනයේ අරමුදලට ගෙවිය යුතු ය.

## උප ලේඛනය [1]

### "අ" ආකෘතිය

20 වන වගන්තිය.

### පොදු සුසානයක භූමදාන ස්ථානයක් ප්‍රදානය කරන ආකෘතිය

සුසාන භූමි සහ භූමිදාන ඉඩම් පිළිබඳ ආඥාපනත යටතේ රජය විසින් . . . . . . ක් වූ . . . . . . . . . . . . . . මස . . . . . දින නිකුත් කරන ලද නියෝගයේ බලය යටතේ . . . . . . . . . . . . . . . හි පොදු සුසානයක් පිහිටුවන ලදු ව, පහත අත්සන් කරන මම එහි සුසාන පාලක වෙමි.

ඒ අනුව, . . . . . . . . . . . . . . . . . පදිංචි . . . . . . . . . . . . . . . . විසින් මට ගෙවන ලද රුපියල් . . . . . . . . . . . . . . ක මුදල වෙනුවෙන්, ඉහත කී ආඥාපනතේ විධිවිධාන යටතේ, එකී සුසාන පාලක වශයෙන් පහත විස්තර සඳහන් කර ඇති භූමිය ඉහත කී . . . . . . . . . . . . . . ට සදා කල්හි භූමදානය සඳහා ප්‍රදානය කරමි.

භූමියේ විස්තරය:

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

මාගේ අත්සන යොදා, වර්ෂ . . . . . . . . . . . ක් වූ . . . . . . . . . . . . . . මස . . . . . . . . . දින ප්‍රදානය කරන ලදී.

. . . . . . . . . . . . . . . . . . .

අත්සන

පොදු පරිශීලනය සඳහා පමණි - ගාමිණී ගුණසේකර

[1] 20 වන වගන්තියෙන් හඳුන්වා දී ඇති ආකෘතිවල ආකාරයෙන් හෝ ඊට සමානව පිළියෙල කරගත හැකි බව සඳහන් වන බැවින් පහසුවෙන් තේරුම් ගත හැකි ආකාරයට මේ ආකෘතිවල අර්ථය වෙනස් නොවන සේ සකස් කර ඇත.

## "ආ" ආකෘතිය

### පොදු සුසානයක භූමදානය සඳහා නොමිලයේ භූමියක් ප්‍රදානය කරන ආකෘතිය

සුසාන භූමි සහ භූමදාන ඉඩම් පිළිබඳ ආඥාපනත යටතේ රජය විසින් . . . . . . ක් වූ . . . . . . . . . . . . . . මස . . . . . දින නිකුත් කරන ලද නියෝගයේ බලය යටතේ . . . . . . . . . . . . . . . හි පොදු සුසානයක් පිහිටුවන ලදුව, පහත අත්සන් කරන මම එහි සුසාන පාලක වෙමි.

තව ද මෙහි නම් සඳහන් කර ඇති තැනැත්තාට පහත දැක්වෙන අයිතිවාසිකම නොමිලයේ ප්‍රදානය කිරීම අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත.

එසේ හෙයින් ඉහත කී සුසාන පාලක වූ මම, ඉහත කී ආඥාපනතේ විධිවිධාන යටතේ, පහත විස්තර සඳහන් කර ඇති භූමිය ඉහත කී . . . . . . . . . . . . . . වෙත, භූමදාන කිරීමේ විශේෂ අයිතිවාසිකම, මෙහි අමුණා ඇති කොන්දේසි පිළිබඳ උප ලේඛනයේ විස්තර කර ඇති කොන්දේසිවලට යටත් ව, භූමදාන කිරීමේ කටයුතු සඳහා සදා කල්හි පවතින පරිද්දෙන් ප්‍රදානය කරමි.

භූමියේ විස්තරය:

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

මාගේ අත්සන යොදා, වර්ෂ . . . . . . . . . . ක් වූ . . . . . . . . . . . . . . මස . . . . . . . . . දින ප්‍රදානය කරන ලදී.

. . . . . . . . . . . . . . . . . . . .

සුසාන පාලක ගේ අත්සන

### කොන්දේසි ඇතුළත් උප ලේඛනය

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

පොදු පරිශීලනය සඳහා පමණි - ගාමිණී ගුණසේකර

24 වන වගන්තිය.

## "ඇ" ආකෘතිය

### භූමදාන කිරීමේ අයිතිවාසිකම පවරා දීමේ ආකෘතිය

. . . . . . . . . . . . . . . පදිංචි . . . . . . . . . . . . . .[2] වන මම, . . . . . . . . . . . . . . . . පදිංචි . . . . . . . . . . . . . .[3] විසින් මා වෙත ගෙවන ලද රුපියල් . . . . . . . . . . . . . . ක මුදල පදනම් කර ගෙන සුසාන භූමි සහ භූමදාන ඉඩම් පිළිබඳ ආඥාපනත යටතේ සාදන ලද සුසානයේ සැලැස්මෙහි අංක . . . . . . . . . . දරන, වර්ෂ . . . . . . . . . . . . . ක් වූ . . . . . . . . . . . . මස . . . . . . දින දරන ප්‍රදානයෙන් මා වෙත සදා කල්හි පවතින පරිදි ප්‍රදානය කරන ලැබුවා වූ ද පහත විස්තර කරන ස්ථානයේ භූමදාන කිරීමේ විශේෂ අයිතියක්, ඒ පිළිබඳ ව මා වෙත ඇති අයිතිය, උරුමය හා සම්බන්ධතාවත් ඉහත කී ඉහත කී . . . . . . . . . . . . . . . .[3] ට සදහටම හිමි වන පරිදි, එය මා විසින් යම් කොන්දේසිවලට එකඟ ව දරන ලද්දේ නම් ඒ සියලු ම කොන්දේසිවලට එකඟ ව එකී ස්ථානයේ භූමදාන කිරීමේ විශේෂ අයිතිවාසිකම යථෝක්ත . . . . . . . . . .[3] ට මෙයින් පවරා දෙමි.

භූමියේ විස්තරය:

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

වර්ෂ . . . . . . . . . . ක් වූ . . . . . . . . . . . . මස . . . . . . . . . . දින අත්සන් කරන ලදී.

. . . . . . . . . . . . . . . . . . . .

අත්සන

ප්‍රජා පරිශීලනය සඳහා පමණි - ගාමිණී ගුණසේකර

[2] පැවරුම් කරුගේ නම

[3] පැවරුම් ලාභියාගේ නම